# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,222 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 522 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| | | බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| | | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) හදට හද භාරකාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බලපිටිය ශ්‍රී රාහුලාරාම පුරාණ විහාරස්ථ සාමණේර ආකල්ප සංවර්ධන භික්ෂු විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

521 - B 82219 — 5,403 (2021/04)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත හා විවෘත) - 2021

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/ විදුලි)/පුහුණු ශ්‍රේණිය (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා විවෘත හා සීමිත පදනම මත මධ්‍යම පළාත තුළ පදිංචි හා දිවයිනේ අනෙකුත් පළාත්වල පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :*

1.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

1.2 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

1.3 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකිය. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් හා කලත්‍රයා මෙම පළාතේ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචි අයෙකු වන අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වල පදිංචි සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාව මත මධ්‍යම පළාත් සභාව තුළ වසර 05ක් අනිවාර්යෙන්ම සේවය කිරීමේ කොන්දේසියට යටත්ව බඳවා ගැනේ.

1.4 විවෘත පදනම මත බඳවා ගැනීමේ දී අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

1.5 සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.6 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

1.7 සේවයට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් හා කොන්දේසි, බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමේ සඳහන් දිනට සෑම අතින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණ සුදුසුකම් :*

සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් 2021.05.03 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

2.1 *විවෘත බඳවා ගැනීම.-*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම්* |
|---|---|---|---|
| | *අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම්* | |
| 2.1.1 මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/ යාන්ත්‍රික/විදුලි) III ශ්‍රේණිය | මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | භෞතීය විද්‍යා විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය, යන විෂයයන් තුනකින් එකවර සමත්වීම හෝ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් | 1. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂනික ඩිප්ලෝමාව. (N.D.T.)<br>*හෝ*<br>2. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව<br>*හෝ* |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | |
| | | දෙක සහිතව විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. | 3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;<br>හෝ<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;<br>හෝ<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;<br>හෝ<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br>හෝ<br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br><br>* බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති ඉහත සුදුසුකම්වලට විකල්ප වශයෙන් රා.ප.ච. 46/90හි දක්වා ඇති සුදුසුකම් අදාළ වේ. |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | |
| 2.1.2 මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/ යාන්ත්‍රික/විදුලි පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලයක් සහිත) | මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | භෞතික විද්‍යා, විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන් තුනකින් එකවර සමත්වීම හෝ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය, සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. | 1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (NCT) ලබා තිබීම. (*උදා.* : ජාතික තාක්ෂණ සහතිකය - සිවිල්/විදුලි/යාන්ත්‍රික)<br>*හෝ*<br>2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය (NCIT) ලබා තිබීම ;<br>*හෝ*<br>4. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් |
|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | |
| 2.1.3. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/ යාන්ත්‍රික/විදුලි) පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලයක් සහිත) | මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | භෞතික විද්‍යා විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උසස් ගණිතය, යන විෂයයන් තුනකින් එකවර සමත්වීම හෝ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. | අදාළ නොවේ. |

2.2 *සීමිත බඳවා ගැනීම.-*

(සීමිත පදනම මත අයදුම්කරන්නන් තම ස්ථිර පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් අමුණා එවිය යුතුයි.)

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|
| 2.2.1 මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/ යාන්ත්‍රික/විදුලි) III ශ්‍රේණිය | මව්බස (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම. | ඉහත 2.1 වගුවෙහි 2.1.1 කොටසෙහි සඳහන් වෘත්තීය (තාක්ෂණ) සුදුසුකමක් තිබීම.<br><br>* බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති ඉහත සුදුසුකම්වලට විකල්ප වශයෙන් රා. ප. ච. 46/90 හි දක්වා ඇති සුදුසුකම් අදාළ වේ. | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|
| 2.2.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/ සැලසුම්/ යාන්ත්‍රික/විදුලි) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලයක් සහිත) | මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම. | ඉහත 2. 1 වගුවෙහි 2.1.2 කොටසෙහි සඳහන් වෘත්තීය (තාක්ෂණ) සුදුසුකමක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද තිබීම. | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තු ගත තනතුරක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| 2.2.3 මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/ සැලසුම්/ යාන්ත්‍රික/විදුලි පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලයක් සහිත) | මව්බස (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම. | අදාළ නොවේ | ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

3. *වැටුප් පරිමාණය :*

3.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN3-2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය.

රු. 31,040 - 10 x 445- 11 x 660 - 10 x 730 - 10 x 750- රු. 57,550 (MN 3-2016 වැටුප් ක්‍රමය)

* පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව :- I වසර - රු. 27,140.00 2 වසර - රු. 27,440.00
(2020.01.01 දින සිට, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක V-18 අනුව)

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*

- මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් බඳවා ගැනීමේ කොන්දේසි මේ සඳහා අදාළ වේ.
- පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක ප්‍රතිශතයක් විවෘත ධාරාවෙන් බඳවා ගන්නා අතර ඉතිරි 30% ක ප්‍රතිශතය සීමිත ධාරාවෙන් සම්පූර්ණ කර ගනු ලැබේ.
- පුරප්පාඩු සංඛ්‍යාව 03 ට වඩා අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.
- විවෘත ධාරාව යටතේ වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවෙන් පළමුව බඳවා ගනු ලබන්නේ ඉහත වගුවේ 2.1.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් වන අතර එම සංඛ්‍යාව, පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන්නේ නම් පමණක් 2.1.2 හා 2.1.3 යටතේ වන පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා අයැදුම්කරුවන් ඇතුළත් කර ගනු ලැබේ.
- සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් නොසිටීනම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කර ගනු ලැබේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ. විභාගයේදී දක්වන කුසලතාවය පදනම් කර ගෙන පුරප්පාඩු අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය.

6.2 අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අදාළ ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත්වේ.

6.3 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම වශයෙන් සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

7. *අයදුම් කිරීමේ ක්‍රමය :*

7.1 විභාග ගාස්තුව රු. 600 කි.

7.2 මධ්‍යම පළාත තුළ පදිංචි අයදුම්කරුවන් තම විභාග ගාස්තු ගෙවීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

* මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපතක් අයදුම්පත්‍රය නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලැබෙන බව ද සැලකිය යුතු ය.

7.3 මධ්‍යම පළාතින් බැහැර පළාත්වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් තම විභාග ගාස්තු ගෙවීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුයි.

* තම විභාග ගාස්තු දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් මහනුවර මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 003-1-001-0-000- 6004 දරන ගිණුමට බැර කර ඒ සඳහා බැංකුවෙන් නිකුත් කරන අදාළ රිසිට් පත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

* බැංකු රිසිට් පත පිරවීමේදී ගිණුම් හිමියාගේ නම ''**ලේකම්. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**'' ලෙස සඳහන් **කළ යුතු අතර අයදුම්කරුගේ නම, ලිපිනය, දුරකථන අංකය, ජාතික හැඳුනුම්පත් අංකය හා හේතුව ලෙස**'' මධ්‍යම පළාත් **රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) නිලධාරීන් බඳවා ගැනීම - 2021/පුහුණු ශ්‍රේණියට (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) නිලධාරීන් බඳවා ගැනීම - 2021**'' යනුවෙන් සඳහන් කර බැංකු රිසිට් පත පුරවා එවීම අනිවාර්යය වේ.

7.4 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2021.05.03** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''**ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) නිලධාරීන් බඳවා ගැනීම - 2021/පුහුණු ශ්‍රේණියට (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) නිලධාරීන් බඳවා ගැනීම - 2021**'' යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

8. *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය :*

විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දනුම් දෙනු ලැබේ.

10. *විභාග විෂය නිර්දේශය :*

මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

10.1 *බුද්ධි පරීක්ෂණය :*

කාලය පැය 01 යි, (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකුලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. සියළුම තනතුරු සඳහා වන අයැදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

10.2 *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :*

කාලය පැය 03 යි. (ලකුණු 100) තනතුරට අදාළව තාක්ෂණික දනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*(අ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියේ/පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා

මෙහිදී සිවිල් නිලධාරියෙකුට තිබිය යුතු දනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජල ප්‍රවාහය සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*(ආ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික) III ශ්‍රේණියේ/පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා

මෙහිදී යාන්ත්‍රික නිලධාරියෙකුට තිබිය යුතු දනුම පරීක්ෂා කිරීම සඳහා යාන්ත්‍රික තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු කොටසකි.

*(ඇ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (විදුලි) III ශ්‍රේණියේ/පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා

මෙහිදී විදුලි නිලධාරියෙකුට තිබිය යුතු දනුම පරීක්ෂා කිරීම සඳහා විදුලි තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු කොටසකි.

*(ඈ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සැලසුම්) III ශ්‍රේණියේ/පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා

මෙහිදී සැලසුම් ශිල්පී නිලධාරියෙකුට තිබිය යුතු දනුම පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සේවයේ තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු කොටසකි.

11. *අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස් :*

ආදර්ශ අයැදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-4 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතු ය.

තනතුරු එකකට වඩා අයැදුම් කරන්නේ නම් එම අයැදුම්කරුවන් වෙන් වෙන්ව අදාළ තනතුරු සඳහා අයැදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

11.1 විභාගයට පෙනී සිටීමට අයදුම් කරන දිස්ත්‍රික්කයට අදාළ අංකය ඊට අදාළ කොටුවේ සඳහන් කළ යුතුය.

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

11.1.1 මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ එක් එක් තනතුර සඳහා වෙන් කර ඇති සංකේත අංක III ශ්‍රේණිය/පුහුණු ශ්‍රේණිය

| | | |
|---|---|---|
| සිවිල් | - | 01-C |
| යාන්ත්‍රික | - | 01-M |
| විදුලි | - | 01-E |
| සැලසුම් | - | 01-D |

11.2 අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.3 යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.4 රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයැදුම්කරුවන් තම අයැදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින විභාගය සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;
* වලංගු රියදුරු බලපත්‍රය ;
* වලංගු විදේශ ගමන් බලපත්‍රය.

මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙම බඳවා ගැනීම් සම්බන්ධ වැඩිදුර විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර අදාළ අයැදුම්පත්‍රය ද එහිදී භාගත කරගැනීමට හැකි බවද කාරුණිකව දන්වමි.

ටී. ඒ. ඩී. ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2021 මාර්තු මස 26 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/යාන්ත්‍රික/විදුලි) තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත/සීමිත තරග විභාගය - 2021**

**Open/Limited Competitive Examination for Recruitment to Post of Technical Officer (Civil/Draftsman/Mechanical/ Electrical) in Central Provincial Public Service - 2021**

විභාග අංකය : ...............
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ............... සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4

තනතුර : ...............

විභාගයට පෙනී සිටින පදනම : ...............
(විවෘත - 1, සීමිත - 2)

පදිංචි දිස්ත්‍රික්කය : ...............

තනතුරට අදාළ සංකේතය : ...............

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

විභාගයට පෙනී සිටීමට අයදුම් කරන දිස්ත්‍රික්කයට අදළ සංකේත අංකය : ...............

01. 1.1 මුලකුරු සමග නම :..........................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(*උදා.* : SILVA A. B. C. D.)

1.2 මුලකුරු සමග නම :- ..........................................................................
(මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................
..........................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................
..........................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................
..........................................................................

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................
..........................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................
..........................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය : : ..........................................................................
..........................................................................

2.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය - 0 - පුරුෂ, 1 - ස්ත්‍රී [ ]

03. 3.1 උපන් දිනය :

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2021.05.03) වයස : අවුරුදු :................, මාස :............, දින :.................

3.3 දුරකථන අංකය : ජංගම : | | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

04. විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1, විවාහක - 2 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.............................................................................................................

| *ඡන්ද හිමි නාමලේඛනයට අනුව පදිංචිය* | *2018* | *2019* | *2020* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. *අධ්‍යාපන සුදුසුකම් :-*

6.1 අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය :
වසර :....................... විභාග අංකය :...........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ. පො. ස. (උසස් පෙළ) විභාගය :
වසර :....................... විභාග අංකය :...........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. *වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *පාඨමාලාවේ වලංගු දිනය* | *NVQ මට්ටම* | *NVQ සහතිකපත් අංකය* | *වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |

08. *අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේනම්) ඃ*

| *දෙපාර්තමේන්තුව/ ආයතනය* | *දැරූ තනතුර* | *කාලය* | | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |

09. *විභාග ගාස්තු රු. 600/- ගෙවීම පිළිබඳ තොරතුරු ඃ*

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ/මහජන බැංකු ශාඛාවේ නම ඃ-..........................................................................

(ii) දිනය ඃ-..........................................................................................................................

(iii) කුවිතාන්සි අංකය ඃ-...............................................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත/රිසිට් පත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br>(ලදුපතේ/රිසිට් පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

10. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ? ...............................................................................................

එසේ නම් විස්තර දක්වන්න. ..........................................................................................................................................

**අයදුම්කරුගේ ප්‍රකාශය**

11. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මා දනිමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

දිනය ඃ........................ ................................................,

අයදුම්කරුගේ අත්සන.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................................ මහතා/ මහත්මිය/ මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.......................................................

සහතික කරන්නාගේ
අත්සන (නිල මුද්‍රාව සහිතව).

දිනය ඃ.................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම ඃ...................................................................................
තනතුර ඃ..................................................................................
ලිපිනය ඃ..................................................................................

13. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම අයැදුම්කරු වන ...................................................................මහතා/මහත්මිය/මෙනවිය ඉහත තනතුර සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා එම නිවේදනයේ සඳහන් සුදුසුකම් සෑම අතින්ම සම්පූර්ණ කර ඇති අතර ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...................................................................තනතුරේ ස්ථිර නිලධාරියෙකු වශයෙන් සේවය කරයි. පසුගිය වසර ............. තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවත්, අදාළ ක්ෂේත්‍රයේ වසර .......................සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් ඇති බවත් සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය :....................................

..........................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව සහිතව)

04-353

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **අප්‍රේල්** | 2021.04.01 | බ්‍රහස්පතින්දා | 2021.03.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.09 | සිකුරාදා | 2021.03.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.16 | සිකුරාදා | 2021.04.01 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.04.23 | සිකුරාදා | 2021.04.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.30 | සිකුරාදා | 2021.04.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2021.05.07 | සිකුරාදා | 2021.04.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.13 | බ්‍රහස්පතින්දා | 2021.04.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.21 | සිකුරාදා | 2021.05.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.28 | සිකුරාදා | 2021.05.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ජුනි** | 2021.06.04 | සිකුරාදා | 2021.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.11 | සිකුරාදා | 2021.05.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.18 | සිකුරාදා | 2020.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.25 | සිකුරාදා | 2020.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.